**ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය - 2020**

**---------------------------------**

**1.** **මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**1.1** **තත්ත්වාගණනය කළ මතය**

**-------------------------------**

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2** **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**-------------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**-----------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්රකාශන වල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශන වල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07 හි 49 ඡේදය ප්‍රකාරව දේපළ, පිරියත හා උපකරණ අයිතමයක් ප්‍රත්‍යාගණනය කිරීමේදි එම වත්කම අයත් වන දේපළ, පිරියත හා උපකරණ පන්තිය මුළුමනින්ම ප්‍රත්‍යාගණනය කළ යුතු වුවත් , ගෘහ භාණ්ඩ හා සවිකිරීම් පන්තිය තුල , කාර්යාල හා සුහසාධක උපකරණ පන්තිය තුල සහ පුස්තකාල පොත් පන්තිය තුල පිරිවැය රු.6,957,152 ක් වන අයිතමයන් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි . | ඉදිරියේදි එම ප්‍රමිති ප්‍රකාරව කටයුතු කරන ලෙස නිලධාරීන්ට උපදෙස් දෙනු ඇත. | දේපළ, පිරියත හා උපකරණ අයිතමයක් ප්‍රත්‍යාගණනය කිරීමේදි එම වත්කම අයත් වන දේපළ, පිරියත හා උපකරණ පන්තිය මුළුමනින්ම ප්‍රත්‍යාගණනය කළ යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07 හි 90 ඡේදය ප්‍රකාරව රු.3,727,380 ක පිරිවැයක් සහිත දේපළ, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනයේදි ආයතනය විසින් අනුගමනය කරන ලද ක්‍රියාපටිපාටිය පිළිබඳව මූල්‍ය ප්‍රකාශන වල ප්‍රමාණවත් හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි. | ඉදිරියේදි එම ප්‍රමිති ප්‍රකාරව කටයුතු කරන ලෙස නිලධාරීන්ට උපදෙස් දෙනු ඇත. | දේපළ, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනයේදි ආයතනය විසින් අනුගමනය කරන ලද ක්‍රියාපටිපාටිය පිළිබඳව මූල්‍ය ප්‍රකාශන වල ප්‍රමාණවත් හෙළිදරව් කිරීම් කළ යුතුය. |

## 1.5.2 අනුචිත ඇගයීම හෝ ඇස්තමේන්තු කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දේපළ, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කිරීමේ දී ආයතනය විසින් කාර්ය මණ්ඩල සාමාජිකයින් 5 දෙනෙකුගෙන් සැදුම්ලත් කමිටුවක් මේ සඳහා යොදාගෙන තිබූ අතර තක්සේරුකරණය පිළිබඳ එම කමිටුවේ සාමාජිකයන්ගේ දැනුම සහ සුදුසුකම් පිළිබඳ විගණනයේදි සෑහීමකට පත්විය නොහැකි බැවින් ප්‍රත්‍යාගණනය තුලින් පැන නැගී ප්‍රත්‍යාගණන වටිනාකම් පිළිබඳ විගණනයේ දී ගැටළු සහගත විය. | ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ සිටිනුයේ ඉතා සීමිත කාර්යයා මණ්ඩලයක් වන අතර ඉන් තුනෙන් එකක් පමණ සිටිනුයේ ප්‍රාථමික ශ්‍රේණියේ සේවකයන්ය. ඒ අනුව සිටින සේවක සංඛ්‍යාවෙන් වුවද ඉතාම සුදුසු අය තෝරා ගෙන වත්කම් ප්‍රත්‍යාගණනය සිදුකරන ලදී. | දේපළ, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කිරීම සුදුසුකම් ලත් කමිටුවක් විසින් සිදුකළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 5.4.10 | මණ්ඩලය විසින් වර්තමාන සන්නිවේදන ප්‍රවණතා හා ජනතා අයිතිවාසිකම් පිළිබඳ සිදුකරන ලද ග්‍රාහක සමීක්ෂණය සිදුකිරීම සඳහා පුද්ගලික ආයතනයක් සමඟ රු.1,830,000 කට ගිවිසුම ගතවී තිබුණ ද කොන්ත්‍රාත් මුදලින් සියයට 10 ට නොඅඩු කාර්යසාධන සුරක්ෂණයක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිකිරීම් කොන්ත්‍රාත්තු, භාණ්ඩ කොන්ත්‍රාත්තු වැනි අවස්ථා වලදී ලංසු සුරක්ෂතා සහ කාර්යසාධන සුරක්ෂණ ආදිය ලබා ගත්ත ද මණ්ඩලය ලබාගත් සේවාවේ ස්වභාවය අනුව සේවා සපයන්නන්ගෙන් මෙවැනි සුරක්ෂණයක් ලබා ගැනීම දුෂ්කර කාර්යයක් බැවින් එම ආයතන සමග ගිවිසුම් ප්‍රකාරව කටයුතු කිරීමට මණ්ඩලය තීරණය කරන ලදී. ඒ අනුව මණ්ඩලයට අගතිදායක නොවන පරිදි ගිවිසුම සකස්කර අතර මෙහිදි සම්පූර්ණ වටිනාකමින් සියයට 40 ක් අවසන් වාර්තාව මණ්ඩලයට ඉදිරිපත් | මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | කිරීමෙන් අනතුරුව ගෙවීම් සිදුකළ යුතු බව ගිවිසුමට ඇතුලත් කරන ලදී. ඒ අනුව මෙම එකඟතා ගිවිසුමට අනුව සේවා ලබාගත් බැවින් අවසාන වාර්තාව දක්වා ප්‍රශස්ත සේවාවක් ලබා ගැනීමට හැකි විය. | |
| (ආ) පුවත්පත් මණ්ඩල පනතේ 18 වන වගන්තිය | එම වගන්තිය ප්‍රකාරව දඩ මුදල් ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු වුවද සමාලෝචිත වර්ෂය තුලදී පුවත්පත් ලියාපදිංචි කිරීමේ ප්‍රමාද ගාස්තු වශයෙන් අය කරන ලද රු.59,100 ක මුදලක් ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. | මණ්ඩලය ආරම්භයේ සිටම මණ්ඩලයේ ආදායම් මණ්ඩල අරමුදල් ගිණුමට බැර කරනු ලැබූ අතර මහා භාණ්ඩාගාරයෙන් ලැබෙන මුදල් හා අනෙකුත් ආදායම් ද බැර කරනු ලබන්නේ මෙම ගිණුමට වේ. කෙසේ වෙතත් ඉදිරියේදි දඩ මුදල් ලෙස අයකරගන්නා ආදායම් ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට නිලධාරීන්ට උපදෙස් දෙන ලදී. | දඩ මුදල් ඒකාබද්ධ අරමුදලට බැර කිරීම් කළ යුතුය. |

## 1.7 මුදල් කළමණාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මණ්ඩලය විසින් පිළිවෙලින් 1993 නොවැම්බර් 05 සහ 2009 සැප්තැම්බර් 07 දිනයන් හි ආරම්භ කරන ලද පර්යේෂණ අරමුදල සහ ණය අරමුදල සඳහා බැංකු ගිණුම් දෙකක් පවත්වාගෙන යන අතර සමාලෝචිත වර්ෂය අවසානයට එම ගිණුම්වල ශේෂය පිළිවෙලින් රු.3,838,805 ක් සහ රු.1,511,031 ක් විය. අංක එෆ්අයිඑන්/පීඊඑන් 168/සහ 2017 දෙසැම්බර් 19 දිනැති මණ්ඩලයේ සභාපතිගේ ලිපිය මගින් | මණ්ඩලය මගින් විටින් විට සිදුකරනු ලබන ඉල්ලීම් වලට අනුව ණය අරමුදල සඳහා 2020.01.21 දින රේඛීය අමාත්‍යාංශය මගින් යෝජනාවක් ඉදිරිපත් කර ඇති අතර විගණන කළමනාකරණ කමිටුවේ ද මේ පිළිබඳ සාකච්ජා කරන ලදී. ඉදිරියේදි තවදුරටත් එම යෝජනාව ක්‍රියාත්මක කිරීමෙන්ම අදාළ අනුමැතීන් | අරමුදල් ගිණුම් පවත්වාගෙන යාම සඳහා විධිමත් අනුමැතියක් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| මෙම අරමුදල් ගිණුම් පවත්වාගෙන යාම සඳහා රාජ්‍ය අයවැය දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ඉල්ලා තිබුණද 2021 මාර්තු 10 දින වන විටත් එම අනුමැතිය ලැබී නොතිබුණි. | ලබාගැනීමේ කටයුතු සිදුකරනු ඇත. | |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.3,973,060 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.1,487,617 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 2,485,443 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ඩිප්ලෝමා සහ සහතිකපත්‍ර පාඨමාලා වියදම අඩුවීම සහ, විදේශ ගමන් වියදම් අඩුවීම ආදිය ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය**

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2016 වර්ෂයේ සිට මූල්‍ය අතිරික්තතාවයක් ඇති වී තිබුණි. සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් ගැලපීමෙන් පසු 2019 වර්ෂයේදී රු.18,210,648 ක් වූ දායකත්වය සමාලෝචිත වර්ෂයේදී රු.21,977,311 ක් දක්වා සියයට 21 කින් වැඩි වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය හා පුවත්පත් පැමිණිලි කොමිසම පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක් සිදුකර පර්යේෂණ වාර්තාවක් ඉදිරිපත් කිරීම සඳහා ගිවිසුමකට එළඹ, ඒ වෙනුවෙන් රු.200,000 ක අත්තිකාරම් මුදලක් කැලණිය විශ්වවිද්‍යාලයේ ජනසන්නිවේදන අංශය වෙත 2015 නොවැම්බර් 24 දින ගෙවා තිබුණු අතර, එම ගෙවීමෙන් මාසයක් ඇතුළත සමස්ත පර්යේෂණ වාර්තාව ඉදිරිපත් කළ යුතුව තිබුණ ද 2021 මාර්තු 10 දින වනවිටත් එම වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | මේ පිළිබඳ විගණන කළමනාකරණ කමිටු රැස්වීමේදී ද සාකච්ඡා කළ අතර එහිදි යෝජනා වූයේ මේ වන විට පර්යේෂණය අවසන්කර ඇති වාර්තාව ලබාගෙන තවදුරටත් මුදල් නොගෙවන බවට එකඟතාවයක් ලබාගෙන අදාල පර්යේෂණය අවසන් කරන ලෙසයි. | අදාල වාර්තාව ලබාගැනීමට කටයුතු කළ යුතු ය. |

| | | |
|---|---|---|
| (ආ) 2010 මැයි 14 දිනැති අංක සීඒ/1/17/1 දරන ජනාධිපති ලේකම් කාර්යාල ලිපියේ 1 ඡේදය සහ පොදු ව්‍යාපාර කාරක සභාවේ 2012 ජුලි 10 දිනැති අංක 7 නියෝගය එම නියෝගය ප්‍රකාරව මණ්ඩලය රජයේ ගොඩනැගිල්ලක පවත්වාගෙන යායුතු වුවද, මණ්ඩලය ආරම්භයේ සිට වසර 21 ක පමණ කාලයක් කුලියට ලබාගත් පෞද්ගලික ගොඩනැගිලි වල පවත්වාගෙන ගොස් තිබුණ අතර, ඒ වෙනුවෙන් 2010 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා පමණක් ගොඩනැගිලි කුලී වශයෙන් රු.26,108,800 ක් වැයකර තිබුණි. | අදහස් දක්වා නොමැත. | රජයේ ආයතන සමඟ තවදුරටත් සාකච්ජා කර සුදුසු ගොඩනැගිලි පරිශ්‍රයක් තෝරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) 1981 ඔක්තෝබර් 14 දිනැති අංක 162/5 ඒ දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කර තිබෙන පුවත්පත් කලාවේදීන් සඳහා වූ ආචාර ධර්ම සංග්‍රහයට අනුව දිනපතා පළවන පුවත්පත් විමර්ශනය කර බැලීම සඳහා ක්‍රමවේදයක් පැවතියද පළවන පුවත්පත් ප්‍රමාණයට සාපේක්ෂව සීමිත විමර්ශන වාර්තා ප්‍රමාණයක් පමණක් ඉදිරිපත් කර තිබුණු අතර එකී විමර්ශන වාර්තා සම්බන්ධයෙන් ද ආචාරධර්ම පිළිපැදීම පිළිබඳව අවශ්‍ය ඇගයීම් සිදුකිරීම කෙරෙහි මණ්ඩලයේ ප්‍රමාණවත් අවධානය යොමුවී නොතිබුණි. | කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් රට තුළ ප්‍රකාශයට පත් වූයේ සීමිත පුවත්පත් සංඛ්‍යාවක් වන අතර ඒවා ද මුද්‍රිත පිටපත් වෙනුවට ඉලෙක්ට්‍රෝනික පිටපත් ලෙස නිකුත් විය. අනපේක්ෂිත මෙම තත්ත්වය අනෙකුත් ක්ෂේත්‍රයන්ට මෙන්ම මණ්ඩලය ද මුහුණ දීමට සිදු වුණු අතර ලැබුණු සීමිත පිටපත් කීපය තුලින් උපරිම විමර්ෂණයක් සිදු කිරීමට මණ්ඩලය උත්සාහ කරන ලදී. එසේම බොහෝ පුවත්පත් මුද්‍රිත හෝ ඊ පිටපත් හෝ ප්‍රකාශයට පත් නොකිරීමට ද කටයුතු කරන ලදී. | විමර්ශණ වාර්තා සම්බන්ධව සහ ආචාරධර්ම පිළිපැදීම පිළිබඳව අවශ්‍ය ඇගයීම් සිදුකිරීම කෙරෙහි අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රමාණවත් අවධානය යොමුවිය යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පුවත්පත් මණ්ඩල පනතේ 30 වන වගන්තිය ප්‍රකාරව ලියාපදිංචි නොකර වෙළඳපලට නිකුත්කරන පුවත්පත් සම්බන්ධව අවශ්‍ය රීති හා නියෝග සම්පාදනයට කටයුතු කර නොතිබුණි. | අතිගරු ජනාධිපතිතුමාගේ සෞභාග්‍ය දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව පුවත්පත් වලට පමණක් සීමා වූ පුවත්පත් මණ්ඩල පනත විද්‍යුත් හා සමාජ මාධ්‍යයන් ද ආවරණය වන පරිදි ව්‍යුහගත | ලියාපදිංචියකින් තොරව අලෙවි කරන පුවත්පත් පිළිබඳව විමර්ශණය කිරීමට මණ්ඩලය කටයුතු කළ යුතු ය. |

| | | |
|---|---|---|
| | කිරීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී. එබැවින් මේ වන විට සියළුම මාධ්‍යයන්ගේ ලියාපදිංචිය, අධීක්ෂණය හා යම් අපහාසාත්මක කරුණක් ඒවායේ පළවූ විට ක්‍රියාත්මක කළ යුතු ආකාරය පිළිබඳව නීති කෙටුම්පත් කරමින් පවතී. | |
| (ආ) පුවත්පත් මණ්ඩල පනතේ 09 වන වගන්තිය ප්‍රකාරව පුවත්පත් වලට හා කර්තෘවරුන් ආදීන්ට විරුද්ධව මණ්ඩලය විසින් ක්‍රියා කළ යුතු වුවද සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රවෘත්ති පත්‍ර වලට විරුද්ධව මහජනතාව සහ විවිධ ආයතනවලින් ලද පැමිණිලි 71 ක් සහ 2019 වර්ෂයේ නොවිසඳී ඉදිරියට ගෙනා පැමිණිලි 62ක් ද ඇතුළුව මුළු පැමිණිලි සංඛ්‍යාව 133 ක් වූ අතර ඉන් පැමිණිලි 69 ක් සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් විසඳීමට කටයුතු කර නොතිබුණි. | සමාලෝචිත වර්ෂය තුළදී අවස්ථා දෙකකදී රට තුල කොවිඩ් වසංගත තත්ත්වය පැවති හේතුවෙන් පුවත්පත් පැමිණිලි විභාග කිරීම සීමා කරන ලදී. එම තත්ත්වය පහව ගිය පසුව පැමිණිලි විභාගයන් ආරම්භ කරන ලදී. | පුවත්පත් පැමිණිලි සඳහා විසඳුම් ලබාදීමේ කටයුතු කඩිනම් කළ යුතුය. |

**4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් වූ වැඩ සටහන් 08 ක් ක්‍රියාත්මක කිරීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි. | ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය මගින් සිදු කරනු ලබන බොහෝමයක් වැඩසටහන් විවිධ කණ්ඩායම් හා පුද්ගලයන් සම්බන්ධ කර ගනිමින් අගනුවර හා ඉන් පරිබාහිරව සිදු කරනු ලබන වැඩසටහන් වේ. විශේෂයෙන්ම පාසල් ළමුන්, ගුරුවරුන් හා මාධ්‍යවේදීන් සම්බන්ධ කර ගනිමින් වැඩසටහන් පවත්වනු ලබයි. කෙසේ වෙතත් පසුගිය වසරේ අවස්ථා දෙකකදී ඇති වූ කොවිඩ් වසංගත තත්ත්වය හා සෞඛ්‍ය මාර්ගෝපදේශයන් අනුව පිරිස් රැස් කිරීම් සඳහා වූ සීමාකම් නිසා වසර | ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව වැඩසටහන් පැවැත්වීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | පුරාම එවැනි වැඩසටහන් ක්‍රියාත්මක නොකරන ලදී. | |
| (ආ) සමාලෝචිත වර්ෂය තුල ලියාපදිංචි කල යුතු පුවත්පත් සංඛ්‍යාව 250 ක් සහ ඇස්තමේන්තු ගත පුවත්පත් ලියාපදිංචි ආදායම රු.500,000 ක් වුව ද සත්‍ය වශයෙන්ම ලියාපදිංචි කල පුවත්පත් සංඛ්‍යාව 172 ක් වූ බැවින් පුවත්පත් 78 ක් සඳහා ලියාපදිංචි ආදායම හඳුනාගත යුතු වුවද පුවත් පත් 15 ක් සඳහා රු.86,000 ක් පමණක් ආදායම වශයෙන් හඳුනාගෙන තිබුණු අතර ඉතිරි පුවත්පත් 63 සඳහා ආදායම් හඳුනාගෙන නොතිබුණි. | පෙර වර්ෂවල ලියාපදිංචි වූ පුවත්පත් ප්‍රමාණය සලකා බලා ඉදිරි වර්ෂ සඳහා යම් ප්‍රමාණයක් ලියාපදිංචි වී යැයි උපකල්පනය කර එම සංඛ්‍යාව ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කරනු ලබයි. මෙය උපකල්පිත අගයකි. අදාළ වසරේ කොරෝනා වසංගත පැවති තත්ත්වය හේතුවෙන් ප්‍රකට ජාතික පුවත්පත් මුද්‍රිත පිටපත් වෙනුවට භාවිතා කරනු ලැබුවේ ඉලෙක්ට්‍රොනික පිටපත්ය. පුවත්පත් කර්මාන්තයට මෙම තත්ත්වය ඉතා තදින් බලපෑම් සිදු කල බැවින් අපේක්ෂිත (මාසික, ත්‍රෛමාසික, වාර්ෂික) පුවත්පත් හා සඟරා පුවත්පත් මණ්ඩලයේ ලියාපදිංචි නොකරන ලදී. | ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව පුවත්පත් ලියාපදිංචි කිරීම් කළ යුතුය. |
| (ඇ) එක් වැඩසටහනකට රු.50,000 බැගින් වන පරිදි මාධ්‍යවේදීන් සඳහා සුභසාධක වැඩසටහන් 10 ක් පැවැත්වීමට මණ්ඩලය සැලසුම්කර තිබුණු නමුත්, සමාලෝචිත වර්ෂය තුල එක් වැඩසටහනක් පමණක් පවත්වා තිබුණු අතර ඒ සඳහා රු. 802,897 ක් වැයකර තිබුණු බැවින් මණ්ඩලයේ ප්‍රගති වාර්තාවෙ හි මූල්‍ය කාර්යසාධනය ලෙස සියයට 140 ක් පෙන්නුම් කළ ද එය අයවැයගත ප්‍රමාණය ඉක්මවා තිබුණි. | ඉහත පරිදි රු.500,000 ක් පමණ වැය කර එකක් රු.5000 කට සරිලන පාසල් උපකරණ කට්ටල 100 ක් ලබාදීමට කටයුතු කළ අතර ඉතිරි මුදල වැය වූයේ එදින පැවති වැඩ මුළුව සඳහාය. රටේ පවතින කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් දීප ව්‍යාප්තව මණ්ඩලය මගින් පවත්වනු ලබන වැඩමුළු මාලාව මෙම වසරේ පැවැත්වීමට නොහැකි වුවද, මණ්ඩලයේ අරමුණු හා කාර්යභාරය පිළිබඳවත්, මාධ්‍යවේදීන්ගේ සුභසාධනය පිළිබඳව ඇති වැදගත්කම දැනුවත් කිරීම් උදෙසාත්, විශේෂයෙන්ම මාධ්‍යවේදීන්ගේ සුභසාධනය තුළින් ප්‍රශස්ත මෙහෙවරක් ඔවුන්ගෙන් මෙරටට සිදු කර ගැනීමේ අපේක්ෂාව සඳහාත් මෙම වැඩමුළුව පවත්වන ලදී. | ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව වැඩසටහන් පැවැත්වීමට කටයුතු කළ යුතුය. |

## 4.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 133 හා 134 ප්‍රකාරව මණ්ඩලය තුළ අභ්‍යන්තර විගණන අංශයක් ක්‍රියාත්මක නොවන අතර මණ්ඩලයේ අනුමත කාර්ය මණ්ඩලයට අභ්‍යන්තර විගණන තනතුරක් ඇතුළත් කර නොතිබුණි | මෙම අභ්‍යන්තර විගණන තනතුර සම්බන්ධයෙන් 2019.07.18, 2019.07.25, 2019.08.07, 2019.08.19, 2019.09.12, 2020.08.25 යන දිනයන් හි කළමනාකරණ සහකාර දෙපාර්තමේන්තුව, රේඛීය අමාත්‍යාංශය හා මණ්ඩලය අතර හුවමාරු වූ ලිපි මගින් අදාළ තනතුරු ඇති කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇති අතර ඒ පිළිබඳ අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ගද සිදු කරමින් පවතී. | මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව අභ්‍යන්තර විගණන අංශයක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |

## 4.3 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අයවැයගත හා තත්‍ය ආදායම් අතර සියයට 5 සිට සියයට 67 දක්වාත් අයවැයගත හා තත්‍යවියදම් අතර සියයට 5 සිට සියයට 100 දක්වාත් විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි. | රට තුළ පැවති කොවිඩ් වසංගත තත්ත්වය නිසා ආයතනික කටයුතු අත්‍යාවශ්‍යම කටයුතු සඳහා සීමා කිරීම හේතුවෙන් බොහෝ සැලසුම් කර තිබූ කටයුතු සිදු කිරිමට නොහැකි වීම හේතුවෙන් මෙවැනි විචලනයක් ඇති වී ඇති අතර ඉදිරියේදි මෙවැනි විචලනයන් අවම කරමින් අයවැය ලේඛණය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කර ගැනීම සඳහා නිලධාරීන්ට උපදෙස් දෙන ලදී. | අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කර ගැනීමට කටයුතු කළ යුතුය. |